සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජූලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2023-08-19
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ලැයිස්තුගත පොදු සමාගමක් වන **සීමාසහිත ට්‍රස්ට් පොදු සමාගම** විසින් එහි දැනට සිටින විගණකවරයා මීට වසර හතකට (07) පෙර සිට පත්කරන ලදි. එකී විගණකවරයා තනිව පරිචයෙහි නිරත වන්නෙකි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට වූ සැළකිය යුතු අන්දමේ අනුගත නොවීම් දහයක් (10) දක්වමින් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය [Sri Lanka Accounting and Auditing Standards Monitoring Board (SLAASMB)] විසින් සමාගම වෙත ලිපියක් එවා ඇත. විගණකවරයා නැවත පත්කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව වෙතින් නිර්දේශයක් ඉල්ලා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ට්‍රස්ට් පොදු සමාගමේ** විගණන කමිටුවෙහි කාර්යභාරයන් (functions) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) සමාගමේ බාහිර විගණකට අදාලව, විගණන කමිටුව විසින්, **සීමාසහිත ට්‍රස්ට් පොදු සමාගමේ** අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදිය හැකි ප්‍රතිලාභ (benefits) දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ග්ලෙන්රොක් (පෞද්ගලික) සමාගම,** සුඛෝපභෝගී කාමර 45 කින් සමන්විත හෝටලයක් පවත්වාගෙන යනු ලබයි. පහත සඳහන් අවදානම්, සමාගමේ අධ්‍යක්ෂවරයාගේ සැළකිල්ලට යොමු වී තිබේ:

(1) බැංකුවෙහි තැන්පත් කිරීම සඳහා සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් රැගෙන යාම.

(2) වෙනත් ස්ථානයක පවත්වාගෙන යනු ලබන ආපනශාලාවේ දිගින් දිගටම අලාභ වාර්තා වීම.

(3) හෝටල් ක්ෂේත්‍රය, දැනට ශ්‍රී ලංකාවේ අවදානමට ලක්වන ක්ෂේත්‍රයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහතින් හඳුනාගන්නා ලද එක් එක් අවදානම අවම කරගැනීමට භාවිත කළ හැකි ශිල්ප ක්‍රමයක් බැගින් **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත සෙන්යාන් (පෞද්ගලික) සමාගම (සෙන්යාන්),** එහි මෙහෙයුම් කටයුතු 2020 වර්ෂයේදී ආරම්භ කළ නමුත් රටතුළ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ගණකාධිකාරීවරයෙකු බඳවා ගැනීම ප්‍රමාද විය. මේ හේතුවෙන් **සෙන්යාන්** හි වාර්ෂික ගිණුම් සකස් කිරීමද ප්‍රමාද විය. දැන් සමාගමේ වාර්ෂික ගිණුම් සකස්කර ඇති අතර, **සෙන්යාන්** හි කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් 2020/21 සහ 2021/22 යන මූල්‍ය වර්ෂයන්ට අදාල වාර්ෂික විගණනයන් සිදුකරන ලෙස ඔබේ විගණන සමාගමෙන් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සහතික කිරීමේ කාර්යභාරයක් (assurance engagement) බාර ගැනීමේදී හා කළමනාකරණය කිරීමේදී අදාල වන ප්‍රධාන පැතිකඩයන් හා අවශ්‍යතාවයන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

විගණන ආයතනය සහ එහි සේවය කරනු ලබන පුද්ගලයන් වෘත්තීය ප්‍රමිතවලට සහ අදාල වන නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවන බවට වූ සාධාරණ සහතිකවීමක් ලබාගැනීම, විගණන ආයතනයක තත්ත්වපාලන පද්ධතියක් ස්ථාපිත කිරීමේ හා පවත්වාගෙන යාමේ අරමුණ වේ. ආයතනයක තත්ත්වපාලන පද්ධතියක ප්‍රධාන මූලිකාංග කිපයක් තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

විගණන ආයතනයක තත්ත්වපාලන පද්ධතියක ප්‍රධාන මූලිකාංග (key elements) දෙකක්(02) **පැහැදිලි කරන්න**.
(ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ඉන්ටෙල් ලංකා (පෞද්ගලික) සමාගමේ ("ඉන්ටෙල්")** 2023 මාර්තු 31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි උද්ධෘතයන් පහතින් දක්වා ඇත:

**2023 මාර්තු 31 දිනට** *(රු.'000)*

| | |
|---|---:|
| දේපළ, පිරියත සහ උපකරණ ධාරණ අගයට | 570 |
| තොග | 2,850 |
| වෙනත් ජංගම වත්කම් | 420 |
| **මුළු වත්කම්** | **3,840** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 10 |
| රඳවාගත් ඉපැයීම් | 3100 |
| ජංගම වගකීම් | 730 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **3,840** |

මෙම කාර්යභාරය භාර විගණන කළමණාකරු වශයෙන් **ඉන්ටෙල්** හි මූල්‍ය කළමනාකරු සමඟ පවත්වනු ලබන මූලික විගණන සාකච්ඡාවට ඔබ විසින් සහභාගී විය යුතුව ඇත. මෙවර ඔබද ඇතුළුව නවක කණ්ඩායමක් විසින් විගණනය සිදු කරනු ලබයි. තම කණ්ඩායම ද සමඟ කාර්යභාර කාර්යසාධනයෙහි ගුණාත්මකභාවය ඒකාකාරී මට්ටමකින් පවත්වාගැනීමේ වැදගත්කම ඔබගේ කාර්යභාර හවුල්කරු විසින් අවධාරණය කර ඇත.

සමාගමේ භෞතික තොග සත්‍යාපනය සඳහා **ඉන්ටෙල්** විසින් විගණක වෙත ඇරයුම් කර නොමැති නමුත් ඔබ ආයතනය මේ සඳහා පසුගිය වර්ෂවලදී සහභාගී වී ඇත. පසුගිය වර්ෂයට සාපේක්ෂව තොග අගය ඉතා වැඩි බව ඔබ හඳුනාගෙන ඇත. තොග, ඒවායෙහි විකුණුම් මිලට අගය කිරීමට අධ්‍යක්ෂකවරු විසින් තීරණය කර ඇතැයි මූල්‍ය කළමණාකරු විසින් ඔබට දැනුම් දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන **ඉන්ටෙල්** හි විගණන වාර්තාව කෙරෙහි භෞතික තොග සත්‍යාපනය හා තොග අගය කිරීමේ ක්‍රමය බලපානු ලබන්නේ කෙසේද යන්න **විමසන්න**. (ලකුණු 06)

(b) විගණකගේ මතය ගොඩනැගීමේදී සලකා බැලිය ගත යුතු කරුණු හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත Good Bank පොදු සමාගම** (බැංකුව), 2023/24 මූල්‍ය වර්ෂය සඳහා ඔවුන්ගේ විගණක වශයෙන් **රෙක්ස් සහ ෆීලික්ස් (R සහ F)** පත්කිරීමට බලාපොරොත්තු වේ. 2022/23 වර්ෂය සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ලබාදෙන විගණන වාර්තාව තුළ ගිණුම්කරණ ප්‍රමිතවල මූලධර්මයන්ට අනුකූලව ණය හා අත්තිකාරම්වලට අදාළ හානිකරණ ප්‍රතිපාදනයන් සිදු නොකිරීම පිළිබඳව තත්ත්වාගණනයක් අන්තර්ගත වේ. **R සහ F** හි එක් හවුල්කරුවෙකු මෙම කාර්යභාරය පිළිගැනීමට කැමති නමුත්, තත්ත්වාගණනය පිළිබඳව සැලකිල්ලට ගත් විට විගණන කාර්යභාරය පිළිගත යුතුද යන්න පිළිබඳව අනෙක් හවුල්කරුට සැකයක් පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

නව සේවාදායකයෙකු වශයෙන් **සීමාසහිත Good Bank පොදු සමාගමේ** විගණනය භාරගැනීමේ හැකියාව **තක්සේරු කරන්න**. (ලකුණු 05)

(b) **සීමාසහිත Centra පොදු සමාගමේ** (සමාගම) විගණනය භාර හවුල්කරු, සමාගමේ විවිධ උත්සව සඳහා සහභාගී වන බවට නිරීක්ෂණය වී ඇත. තවද, සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් ඔහුගේ දියණියගේ විවාහ මංගල්‍යයටද ඔහුට ඇරයුම් කර තිබේ. මෙම තත්ත්වය විගණන සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුගේ අවධානයට යොමු වී ඇත. ඇරයුම් කරන ලද උත්සව සඳහා සහභාගීවීමට අමතරව ඔහුට වෙනත් සම්බන්ධතාවයක් හෝ ගැටුමක් නොමැති බවත් ඒ නිසා ඔහු **සීමාසහිත Centra පොදු සමාගම** සම්බන්ධයෙන් ගත්කළ සම්පූර්ණයෙන්ම ස්වාධීන බවටත් විගණනය භාර හවුල්කරු තර්ක කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

"ස්වාධීනත්වය" යන සංකල්පය විගණනය භාර හවුල්කරුට **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**RT හෝටලයේ** මෑතකදී සිදුකරන ලද මිලදී ගැනීම්වල ලැයිස්තුවක් පහත දැක්වේ:

| දිනය | භාණ්ඩ ලැබීමේ පත්‍රයේ (GRN) අංකය | සැපයුම්කරුගේ නම | මුදල (රු.) |
|---|---|---|---|
| 2022.10.03 | 4765 | රශී පළතුරු වෙළෙඳ සැල | 52,760 |
| 2023.01.04 | 4766 | රිසාන් මස් වෙළෙඳ සැල | 105,460 |
| 2023.01.04 | 4767 | ෆ්‍රෙෂ් වෙජිටබල් මාට් | 22,900 |
| 2023.02.06 | 4769 | කුසුම් හාඩ්වෙයාර් | 17,800 |
| 2023.03.07 | 4770 | විජය ඩිස්ට්‍රිබියුටර්ස් | 47,900 |

සැපයුම්කරුවන් විසින් ලබාදෙන ණය කාල සීමාව දින 30 කි.

පහත දක්වා ඇති වෙළෙඳ ණයහිමියන්ගේ ලැයිස්තුව 2023 මැයි 10 දිනට වේ: *(රු.)*

| නම | මුළු හිඟ මුදල | දින 0-30 | දින 30-60 | දින 60 වැඩි |
|---|---|---|---|---|
| දිස්නා තේ වෙළෙඳ සැල | 22,700 | | | 22,700 |
| රශී පළතුරු වෙළෙඳ සැල | 52,760 | | | 52,760 |
| රිසාත් මස් වෙළෙඳ සැල | 154,620 | 142,320 | | 12,300 |
| ෆ්‍රෙශ් වෙජිටබල් මාට් | 22,900 | | 22,900 | |
| කුසුම් හාඩ්වෙයාර් | 17,800 | 17,800 | | |
| **මුළු එකතුව** | **270,780** | **160,120** | **22,900** | **87,760** |

**RT හෝටලයේ** හි විගණක ඔබ බවත්, දැනට ඔබ විසින් 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන විගණනය සිදුකරනු ලබන බවත් උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඔබ විසින් බාහිර තහවුරුකිරීම් ලබාගත යුතු සැපයුම්කරුවන් දෙදෙනෙකු(02) **හඳුනා දක්වන්න**. එසේ තෝරාගැනීම සඳහා බලපෑ හේතු **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) බාහිර තහවුරු කිරීම් ලබාගැනීමට අමතරව වෙළෙඳ ණයහිමියන් විගණනය කිරීම සඳහා සිදුකළ යුතු විගණන ක්‍රියා පටිපාටි තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(c) පසුව ඇතිවූ සිදුවීම් (subsequent events) සම්බන්ධයෙන් විගණකගේ වගකීම **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත D ෆැශන් (පෞද්ගලික) සමාගම** (සමාගම), තොග ඇඟළුම් කර්මාන්තය තුළ නියැලී සිටින ප්‍රමුඛපෙළේ සමාගමකි. සමාගමේ අධ්‍යක්ෂ හා ප්‍රධාන කොටස්හිමියා වන **ධනුෂ්ක මහතා** විසින් මෙම ව්‍යාපාරය මීට වසර 12 ට පෙරාතුව එක් මහන මැෂිමකින් ආරම්භ කරන ලදී. ඇඟළුම් සඳහා වන ඉල්ලුම වැඩිවනවාත් සමග ඔහුගේම යන්ත්‍ර සූත්‍රවල සහ ගොඩනැගිලිවල ආයෝජනය කිරීම වෙනුවට ඔහු විසින් නිෂ්පාදන ක්‍රියාවලිය ගෘහස්ත ඇඟළුම් නිෂ්පාදකයන් වෙත උප කොන්ත්‍රාත් පදනම යටතේ ලබාදෙන ලදී. අද වන විට සමාගම සතුව ලියාපදිංචි වූ උප කොන්ත්‍රාත්කරුවන් 50 දෙනෙකු සිටී. මාසිකව ඇඟළුම් ඒකක 50,000 කට වැඩි ප්‍රමාණයක් ප්‍රධාන පෙළේ සිල්ලර ඇඟළුම් අලෙවිකරුවන් වෙත අලෙවිකරනු ලබයි.

ගනුදෙනුකරුවෙකුගෙන් ඇණවුම් ලැබුණු විට නිර්මාණකරණය කරනු ලබන කණ්ඩායම විසින් නිර්මාණකරන ක්‍රියාවලිය ආරම්භ කරනු ලබයි. එක් එක් නිර්මාණය, ඒ සඳහා වූ ගනුදෙනුකරුගේ අනුමැතියද සහිතව උප කොන්ත්‍රාත්කරු වෙත බාරදෙනු ලැබේ. මීළඟ පියවර සාම්පල සඳහා අනුමැතිය ලබා ගැනීමයි. අනුමත කරන ලද නිර්මාණය සඳහා උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් සාම්පල දෙකක් නිපදවිය යුතුය. සමාගම විසින් සාම්පලය අනුමත කිරීමෙන් පසුව උප කොන්ත්‍රාත්කරුට වාණිජ්‍යව නිෂ්පාදනය ආරම්භ කිරීමට පුළුවනි.

ගනුදෙනුකරුවන්ට මාසයක ණය කාල සීමාවක් ලබාදෙනු ලැබේ. කෙසේනමුත් 2023 මාර්තු 31 දිනට, මාස 6 කට වඩා හිඟව පවතින රු. මිලියන 14 ක හිඟ ශේෂයක් පැවතුණි. උප කොන්ත්‍රාත්කරුවන් විසින් ණය කාලසීමාවන් ලබාදෙනු නොලැබේ. ඇණවුමක වටිනාකම රු. මිලියනයකට වඩා වැඩිවන විට උප කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් මුදලක් ලබාදිය යුතුය.

මුල්‍ය කණ්ඩායමෙහි එක් ගණකාධිකාරිවරයෙක්, පොත් තබන්නන් 3 දෙනෙක් හා මුදල් අයකැමියෙක් වශයෙන් සාමාජිකයින් පස්දෙනෙක් (05) සිටී. තොග වෙනස්වීම් හා මුල්‍ය ගනුදෙනු වාර්තා කිරීමට අභ්‍යන්තර වශයෙන් සංවර්ධනය කරන ලද මෘදුකාංගයක් භාවිතයට ගනී. භාණ්ඩ ලැබීම් පත්‍රය සඳහා අනුමැතිය ලැබුණු විට ගණකාධිකාරී විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් සිදුකරනු ලබයි. නමුත් උප කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගේ ගිණුම්වල ගෙවිය යුතු ශේෂයන් පවතී. අනුමත කරන ලද නිර්මාණයට හා සාම්පලයට වඩා තොගය වෙනස්වීම හේතුවෙන් සම්පූර්ණ තොගයම ගනුදෙනුකරුවන් විසින් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාද පවතී. ගනුදෙනුකරුවන් විසින් රැගෙන නොගිය රු. මිලියන 15 කට වඩා වැඩි වටිනාකමක් ඇති තොග ගබඩා තුළ පවතී.

**ධනුෂ්ක මහතා** විසින්, අභ්‍යන්තර විගණනයක් සිදුකර දුර්වලතාවයන් පවතින අංශයන් වැඩිදියුණු කරගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස ඔබගේ විගණන ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත D ෆැශන් (පෞද්ගලික) සමාගමේ** අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලකිය යුතු දුර්වලතාවයන් පිළිබිඹු කරන සංඥා තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත D ෆැශන් (පෞද්ගලික) සමාගමේ** ස්ථාපිත කළහැකි පාලන ක්‍රියාකාරකම් තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) **සීමාසහිත D ෆැශන් (පෞද්ගලික) සමාගම** වෙත යෝජනා කළ හැකි වැළැක්වීමේ පාලනයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(d) **සීමාසහිත D ෆැශන් (පෞද්ගලික) සමාගමට** අදාලව ඔබ විසින් හඳුනාගන්නා ලද ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(e) **සීමාසහිත D ෆැශන් (පෞද්ගලික) සමාගමේ** භාණ්ඩ ලැබීමේ පත්‍රවල (GRN) නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි යෙදුම් පාලනයන් දෙකක්(02), එකකට උදාහරණයක් ද සහිතව **සඳහන් කරන්න.**
(ලකුණු 04)
(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

**Eran & Pep (E&P)** වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් වන අතර, එය **සීමාසහිත Yes Finance පොදු සමාගමේ (YF)** බාහිර විගණක ලෙස වසර 3 ක කාලයක සිට කටයුතු කරනු ලබයි. මෙම විගණක, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ද නැවත පත්කර ඇත. ඔබ මෙම විගණනය භාර කළමනාකරු වන අතර, විගණනය භාර හවුල්කරු විසින් 2022 විගණනයට අදාල පහත සඳහන් යාවත්කාලීනයන් සාකච්ඡා කර ඇත.:

(1) කළමනාකරණ ලිපියෙහි සඳහන් කරුණු වැඩිදියුණු කරගැනීම සඳහා විගණකගේ යෝජනා ඉදිරිපත් කරන ලෙස කළමනාකාරිත්වය විසින් ඉල්ලීමක් කර ඇත.

(2) සමාගම ලියාපදිංචි මූල්‍ය සමාගමක් වන අතර, සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළදී දැනට පවතින ශාඛා තුළ සමාගම විසින් උකස් මධ්‍යස්ථාන ආරම්භ කර ඇති අතර එය වැඩිදියුණු වන ව්‍යාපාරයකි.

(3) මූල්‍ය සමාගම්වල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි සැළකිය යුතු මට්ටමේ විධානයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇත. ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පවත්වා ගැනීමට මූල්‍ය සමාගමට දැඩි වෙහෙසක් දැරීමට සිදුව ඇත. ඌන ප්‍රාග්ධන මට්ටමක් පැවතීම හේතුවෙන් වෙනත් විශාල මූල්‍ය සමාගමක් සමඟ ඒකාබද්ධ වන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් **YF** ට විධානය කිරීමට ඉඩ ඇත.

(4) අනෙකුත් මූල්‍ය ආයතන සමග සැසඳීමේදී සමාගම, 2022 වර්ෂය සඳහා සුළු ලාභදායිත්වයක් උපයා ඇත.

(5) ණය සහන කාලයක් දීම සහ ගිහ වාරික අයකිරීමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකු විධානවල සීමාවන් පැවතීම නිසා මෙම වර්ෂය මූල්‍ය සමාගම්වලට දුෂ්කර කාලයක් වූ අතර, එමඟින් හානිකරණ සඳහා වූ ප්‍රතිපාදන කෙරෙහි සෘජු බලපෑමක් සිදුව ඇත.

(6) සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් කිහිප දෙදෙනෙකු ඉවත්ව ගොස් ඇති අතර, එම තනතුරු මාස 6 ක කාලයක සිට පුරප්පාඩුව පවතී.

(7) වර්ෂය තුළදී, රූපවාහිනී මාධ්‍ය ආයතනයක් පවත්වාගෙන යනු ලබන **සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගම** සතු කොටස්වලින් 25% ක් **YF** විසින් අත්පත් කරගෙන ඇත.

(8) 2022 වර්ෂය තුළදී නව ප්‍රධාන විධායක නිලධාරියෙකු පත්කර ඇති අතර, වර්ෂය තුළදී ලබාගත් අයභාරය පදනම් කර ගනිමින් ඔහුගේ ප්‍රසාද දීමනාව තීරණය වේ.

සැලසුම්කරණ රැස්වීමේදී, විගණනය සඳහා අදාලවන ප්‍රමාණාත්මකභාවය රු. මිලියන 23 ක් ලෙසත් එය මුළු වත්කම් පදනම් කර ගනිමින් තීරණය කර ඇති බවටත් ජ්‍යෙෂ්ඨ විගණක සඳහන් කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **YF** හි විගණන ක්‍රියාපටිපාටි ඉටුකිරීමේදී විශේෂ අවධානය ලබා දිය යුතු ක්ෂේත්‍ර පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(b) "නව ප්‍රධාන විධායක නිලධාරියා සමඟ පැවති සාකච්ඡාවේදී මූල්‍ය වාර්තාකරණයෙහි පවතින සියලුම වැරදි හා වංචා හඳුනාගැනීම විගණකගේ අරමුණ විය යුතු බවට ඔහු විසින් සඳහන් කර ඇත."

ඉහත සඳහන් ප්‍රකාශය **තක්සේරු කරන්න**. (ලකුණු 05)

(c) සුදුසු මිනුම් ලකුණු (benchmark) මත පදනම්ව ප්‍රමාණාත්මකභාවය ස්ථාපිත කිරීම සඳහා බලපෑ හැකි සාධක හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(d) ඉහත සංසිද්ධිය තුළ සඳහන් අස්තිත්වය හා එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේදී විගණක විසින් සළකා බැලිය යුතු "කර්මාන්තය සහ නියාමන සාධක" පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(e) **YF** හි අඛණ්ඩ පැවැත්ම සමාලෝචනය කිරීමේදී යොදාගත හැකි විගණන පටිපාටි හයක්(06) **සඳහන් කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |